කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 ජූනි

මානවශාස්ත්‍ර පීඨය

# ප්‍රතිබිම්බ කලා

## ප්‍රතිබිම්බ කලාවේ පරිණාමය IMAT – 18224

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

1. ඡායාරූප ශිල්පය බිහිවීමට මගපෑදූ පූර්ව සොයාගැනීම් පිළිබඳ විස්තරයක් කරන්න.

2. ලුයිස් ජැක් මැන්ඩේ ඩැගියුරේ (Louis-Jacques-Mandé Daguerre) සහ හෙන්රි ෆොක්ස් ටැල්බොට් (Henry Fox Talbot) යන දෙදෙනාගෙන් ඡායාරූප ශිල්පයේ ප්‍රවර්ධනය සඳහා ඉටුවූ මෙහෙවර සංසන්දනාත්මකව විස්තර කරන්න.

3. චලන චිත්‍රය බිහිවීමට මගපෑදූ අත්හදාබැලීම් පර්යේෂණ පිළිබඳ විස්තරයක් කරන්න.

4. මැජික් පෙන්වීමේ හා කතන්දර කීමේ කලාවක් ලෙස චිත්‍රපටය භාවිතයට ගත් ආකාරය ජෝර්ජ් මෙලිස්ගේ (Georges Méliès) නිර්මාණ ඇසුරින් පැහැදිලි කරන්න.

5. "ඩී. ඩබ්ලිව්. ග්‍රිෆිත් (D. W. Griffith) සිනමා කලාවේ සෘෂිවරයාණෝය." ඉහත කියමන විස්තර කරන්න.

6. දෘෂ්ටියේ අඛණ්ඩතාව (Persistence of vision) යනු කුමක්දැයි හඳුන්වා, චිත්‍රපට මාධ්‍යයේ පදනම එමගින් සැකසුණු ආකාරය පැහැදිලි කරන්න.

7. රූපවාහිනි මාධ්‍යයේ බිහිවීමට හේතු වූ විවිධ අත්හදා බැලීම් හා පර්යේෂණ පිළිබඳ විස්තරයක් කරන්න.

8. පහත දැක්වෙන මාතෘකා දෙකක් (02) සඳහා කෙටි සටහන් ලියන්න
   i. තෝමස් අල්වා එඩිසන් (Thomas Alva Edison)
   ii. එඩ්වඩ් මයෙබ්‍රිජ් (Eadweard Muybridge)
   iii. ලුමියේ සහෝදරයෝ (Lumiere brothers)
   iv. මොන්ටාජ් රීතිය (Montage)